# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/42 - 2025 අගෝස්තු මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රා.ලේ. යොමු අංකය: DSM/YT/LAND/5/44.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ
යොමු අංකය: 4-3/5/2018/HA/155.

ගලගම ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය:-*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්ගිරි පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ අංක E332, ගලගම ග්‍රාම නිලධාරි වසමේ ගලගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක මා 1845 හි කැබලි අංක 01 ලෙස සඳහන් කහවත්ත එස්ටේට්/හේන මූකලාන නැමති ඉඩමේ, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0207 ක් වූ බිම් කොටස.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: කහවත්ත එස්ටේට්/හේන මූකලාන; විස්තරය: ගලගම ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ඉඩම් අත්කර ගැනීම; හිමිකම් කියන අය: 1. ඩබ්ලිව්. එම්. ආර්. වසන්ත කුමාර විජේසූරිය, අංක 36/2, උරුලෑවත්ත, යටවත්ත; ප්‍රමාණය: හෙක්. 0.0207.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.00 ට යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එච්. එම්. එම්. සී. පී. හිඳගොඩ,**
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2025 අගෝස්තු මස 05 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0148



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: EMDS/LND/08/ACQ/02/04-03.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: LD/05/2007/IR/538.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2409/03 හා 2024 නොවැම්බර් මස 04 වැනි සඳුදා දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම සම්බන්ධයෙනි.

එම දැන්වීමෙහි, දෙවන පරිච්ඡේදයේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 15.1985ක් වූ පහත විස්තර සහිත ඉඩම යන්න, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 35.1985 ක් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

**විශාකා පුබුදුනී පීටර්ස්,**
ප්‍රාදේශීය ලේකම්,
ඇඹිලිපිටිය.

2025 ජූලි මස 30 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0149

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: බල 8/ප්‍රා.ලේ.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: J/73/HA/109.

අංක 151 හා 1975.02.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා බැඳේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය:-*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 20 බී බ්‍රාහ්මණවත්ත දකුණ ග්‍රාම නිලධාරි වසමේ බ්‍රාහ්මන වතුගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද මු.පි.ගා. 737 හා 1975.01.09 දිනැති මුලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්. 24.2 ක් පමණ වූ දේවාලපිටියවත්ත නමැති ඉඩම, ප්‍රාදේශීය උප දිසාපති කාර්යාලයේ ගොඩනැගිල්ල තැනීම සඳහා අත්කර ගැනීම.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දේවාලපිටියවත්ත (වරිපනම් අංක 67න් කොටසක්); විස්තරය: ගෙවත්ත, අවු. 40 ත් 50 ත් අතර වයසැති පොල්ගස් 05 ක් සහ දෙල් ගස් 1 ක් හා පෙදරේරු කරන ලද ළිඳක් ඇත; ප්‍රමාණය: රූඩ් 01 පර්. 24.2.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.00 ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එස්. ඒ. ශාලිකා නිල්මිණි,**
ප්‍රාදේශීය ලේකම්,
බළපිටිය.

2025 අගෝස්තු මස 04 වැනි දින,
බළපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.